www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2009 වසරේ පුද්ගලික ආදායමේ පිරිහීම එක්සත් ජනපද ජනතාවගේ දුගීභාවය පෙන්නුම් කරයි

## Decline in 2009 personal income reveals impoverishment of US population

ඩේවිඩ වොල්ෂ් විසිනි
2010 මාර්තු 27

එක්සත් ජනපද වෙලඳ දෙපාර්තමේන්තුව විසින් 25 දින නිකුත් කරනලද ගනන් හිලව් පෙන්නුම් කරන්නේ, අවපාතයෙන් පසුව නරකම ආර්ථික කොන්දේසි වලට මුහුන පා සිටින පුලුල් ජන කොටස්වල ජීවන තත්වයන් එක දිගට පිරිහෙමින් තිබෙන බවයි.

මේ මස මුලදී වෙලඳ දෙපාර්තමේන්තුවේ ආර්ථික විශ්ලේෂන කාර්යාංශය වාර්තා කලේ, 2009 වසර තුල එක්සත් ජනපදයේ පුද්ගල ආදායම සියයට 1.7 කින් පිරිහී ඇති බවයි. ඇසෝසියේටඩ් ප්‍රෙස් මාධ්‍ය සඳහන් කලේ සියයට 7.7 න් ආදායම පහත වැටුනු මහා අවපාතයේ 1938 වසරින් පසුව, වාර්තාවන දුර්වලම තත්වය මෙය බවයි. පුද්ගල ආදායමේ මෙම පිරිහීම 1949 වසරින් පසුව ඇතිවූ පලමු වැන්නය.

25 දින වෙලඳ දෙපාර්තමේන්තු සංඛ්‍යා ලේඛන එක් එක් ප්‍රාන්තවල තත්වයන් පිලිබඳව අවධානය යොමු කලේය. ප්‍රාන්තවල පුද්ගල ආදායම පිරිහීමේ සාමාන්‍ය ද සියයට 1.7 කි. නෙවාඩා ප්‍රන්තයේ සියයට 4.8 පිරිහීමක් ද බටහිර වර්ජිනියාවේ සියයට 2.1 වර්ධනයක් ද පෙන්නුම් කලේය.

සමස්තයක් ලෙස ගත් විට 2009 වසර තුල ඇමරිකානු ප්‍රාන්ත රාජ්‍ය 42 ක ජනගහනය පුද්ගල ආදායමේ පිරිහීමක් අත්විඳි අතර ප්‍රාන්ත දෙකක වෙනසක් සිදු නොවීය. කොලොම්බියා දිස්ත්‍රික්කයට අමතරව ප්‍රාන්ත 6 ක් වර්ධනයක් පෙන්නුම් කලේය.

වරෙක ආර්ථික හා සමාජ ප්‍රගතියේ පහන් ටැඹක්වූ කැලිෆෝනියාවේ විශ්මිත පරිවර්තනයක් සිදුවෙමින් තිබේ. 2009 වසර තුල මේ ප්‍රාන්තයේ පුද්ගල ආදායම සියයට 2.5 න් පහත වැටුනි. එයවූ කලී අවපාතයෙන් අනතුරුව මේ ප්‍රාන්තය අත්විඳි පලමුවන පිරිහීමයි. සැන්ෆ්‍රැන්සිස්කෝ ක්‍රොනිකල් පුවත්පත වාර්තා කලේ 2009 වසරෙහි "ජාතික පදනමක් මත සිදුවූ එක සමාන ඓතිහාසික පහත වැටීමට වඩා ප්‍රපාතාකාර ලෙස ප්‍රාන්ත ආදායම පහත වැටුනු බවයි. වසර 80 ක ඉතිහාසය පුරාවට කැලිෆෝනියාව පොදුවේ ජාතික සාමාන්‍යය ඉක්මවා ගොස් ඇති බව සැලකිල්ලට ගත් කල මෙය සැලකිය යුතු ප්‍රතිවර්තනයකි.

ප්‍රාන්තය පුරා පුද්ගල ආදායමේ පහත වැටීම "කැලිෆෝනියාව තුල සෑම පිරිමියෙකුට, ගැහැනියකට හා ලමයෙකුට ලැබෙන ආදායමේ ඩොලර් 1527 ක පහත වැටීමක් ලෙස ගනනය කෙරේ" යයි එම පත්‍රය වාර්තා කලේය. ප්‍රාන්තයේ පුද්ගල ආදායම් වාර්තා තැබීම ආරම්භ වූයේ 1929 දීය. 2009 වසරට පෙරාතුව 1929 වසරේ සිට කැලිෆෝනියාවේ පුද්ගල ආදායම පහත වැටී ඇත්තේ පස් වතාවක පමනි. ෆෙඩරල් වාර්තාවලින් ආවරනය කෙරී ඇති වසර 80 තුල කැලිෆෝනියාවේ පුද්ගල ආදායම සියයට 7.3 ක සාමාන්‍යයකින් වැඩිවී තිබේ.

"1930 ගනන් වලින් අනතුරුව ඇතිවූ අයහපත්ම පසුබෑම මෙය බව සංඛ්‍යා වලින් තහවුරු වන්නේ" යයි කැලිෆෝනියාවේ සැන් රැෆායල් හි බීකන් ඉකොනොමික්ස් ආයතනයේ ආර්ථික විශලේෂක ජෝන් හැව්මන් දිනපතා පුවත්පතකට පැවසීය. "වේදනාව පුලුල් ලෙස දැනී ඇතැයි" සටහන් කල ඔහු තව දුරටත් කියා සිටියේ "අප දකින්නේ මධ්‍යම හා පහල පන්තිවල ආදායමේ පිරිහීමකි" යනුවෙනි.

එක්සත් ජනපදය පුරා වැඩකරන ජනතාවන්ගේ ආදයම් පිරිහෙමින් තිබේ. ආර්ථික විශ්ලේෂන කාර්යාංශය ප්‍රකාශ කරන පරිදි, කිසියම් ප්‍රාන්තයක පුද්ගලික ආදාමේ පිරිහීම එහි සුවිශේෂී ආර්ථිකයට අනුරූපී විය.

1969 වසරෙන් පසුව "ප්‍රාන්ත අතුරෙන් දෙවන විශාලතම පිරිහීම" වාර්තාවූ නෙවාඩාහි දී ඊට බෙහෙවින්ම හේතු කාරක වූයේ ඉදිකිරීම් හා කැසිනෝ හෝටල් ද ඇතුලුව නිකේතන පහසුකම් සැපයූ කර්මාන්තයේ ඇද වැටීමයි.

පුද්ගල ආදායම සියයට 3.9 න් පහත වැටුනු වයෝමිං ප්‍රාන්තයේදී ඊට වැඩි කොටම දායක වූයේ තෙල් හා ගෑස් ද ඇතුලුව, කැනීම් හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන්ය. සියයට 3.4න් පුද්ගල ආදායම පහත වැටුනු නිව් යෝර්ක්හි ඊට දායක වූයේ වැඩි වශයෙන්ම මූල්‍ය ක්ෂේත්‍රයේ ඉපැයීම්වල වැටීමයි. කනෙක්ටිකට්හි

ද තත්වය එයම වූ අතර, නිෂ්පාදනය හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන් ද ඒ හා සමානව ම ඊට දායක විය. මිචිගන් ප්‍රාන්තයේ සියයට 3 ක පුද්ගල ආදායම් පිරිහීම කල් පවත්නා භාන්ඩ නිෂ්පාදන අංශයේ විශාල පාඩු පිලිබිඹු කලේය.

වඩාත් අයහපත් ඇතැම් ප්‍රාන්තවලට වඩා මිචිගන් හි යාන්තමින් අඩු අනුපාතයකට අනුව පුද්ගල ආදායම පහත වැටුනි නම් ඊට හේතුව, පිරිහීම වසර ගනනාවකට පෙරාතුව ආරම්භවී තිබීමයි. "2000-2008 අතර කාලයේ මිචිගන්හි ඒක පුද්ගල දල දේශීය නිෂ්පාදිතය 19 ස්ථානයේ සිට 41 ස්ථානය දක්වා වැටුනු බවත් මෙය දශකයකට අඩු කාලයක් තුල වඩාත්ම පලදායී ප්‍රාන්ත අතරින් එකක සිට අඩුම පලදායී ප්‍රාන්ත 10 අතරින් එකක් දක්වා ප්‍රපාතාකාර පහත වැටීමක් බවත්" පොදු ප්‍රතිපත්ති පිලිබඳ මැකිනැක් ආයතනය පෙන්වා දෙයි. සමස්තයක් ලෙස වරෙක එක්සත් ජනපදයේ ඉහලම කාර්මික වැටුප් වලට හිමිකම්කී මිචිගන් ප්‍රාන්තය ඒක ජනක පුද්ගල ආදායම අතින් වර්තමානයේ දරන්නේ 37 ස්ථානයයි.

බොහෝ කොටම සමාජ වැඩසටහන් වලින් සැදුම්ලත් සංක්‍රාම ගෙවීම් මසුරු වුවත්, "දැන් එය මිචිගන්හි සියලු ආදායම් වලින් සියයට 22 කි. සංක්‍රාම ගෙවීම් නොමැති වුවහොත්, ඒක ජනක පුද්ගල ආදායම් අතින් මිචිගන් සියලු ප්‍රාන්ත අතුරින් 41 තැනට වැටෙයි."

පංච මහා විල් ආශ්‍රිත ප්‍රාන්තවල ආර්ථිකයන් මත ආර්ථික පසුබෑම ඉමහත් විනාශයක් ඇති කල අතර "කාර්මික පදනමක් සහිත ඔහායෝ ප්‍රාන්තයෙහි ඒක ජනක ආදායම 2009 වසර තුල සියයට 1.64 කින් පහත වැටුනි. එය එක් නිවැසියෙකුට සිදුකල පාඩුව ඩොලර් 508 කි. ප්‍රාන්තයේ පුද්ගල ආදායම ඩොලර් බිලියන 19.8 න් පහත වැටුනේ යයි *ටොලිඩෝ බ්ලේඩ්* පුවත්පත ලියා ඇත. විල් ආශ්‍රිත තවත් ප්‍රාන්තයක් වන ඉලිනොයිහි පුද්ගල ආදායම සියයට 2.1 න් වැටුනි. එක් මාධ්‍ය වාර්තාවකට අනුව "විශාලතම පාඩු සිදුවූයේ කල් පවත්නා භාන්ඩ හා කැනීම් අංශවල ය."

ටෙනසියන් කොම් වෙබ් අඩවියට අනුව "වසර 60කට පසුව ටෙනසි වැසියෝ පුද්ගල ආදායමේ පරිහානියකට මුහනපෑහ. 1949 සිට පසුගිය වසර තෙක් සෑම අවුරුද්දකම ටෙනසි හි හා ජාතිකව, පුද්ගල ආදායම වර්ධනය වූ බව" විශ්ලේෂන කාර්යාංශයේ ප්‍රධානී ටැනී අල්බෙට්ස්කි පැවසුවාය.

"මිනිස්සු රැකියාවල නොයෙදෙති, යෙදෙන්නන් ද වැඩකරන්නේ සීමිත පැය ගනනකි. රැකියාවල ආදායම් පහත වැටී තිබේ. පවතින්නේ මේ සියල්ලේම සංයුතියයි." ඇය පැවසුවාය. 2009 වසර තුල ෆ්ලොරිඩාවේ නිවැසියන්ට සිය පුද්ගල ආදායමෙන් සියයට 2.7 ක් හෝ ඊට පෙර වර්ෂයට සාපේක්ෂව ඩොලර් බිලියන 20 ක් අහිමි විය. වරෙක සෞභාග්‍යමත් ප්‍රාන්තයක්වූ ෆ්ලොරිඩාව ශ්‍රේනිගත වූයේ ආදායම් වර්ධනයේ ජාතික මට්ටටමෙන් පහලම තත්වයට ආසන්න තැනකය.

ඇලබාමාහි නිවැසියන් සියයට එකක පිරිහීමකට මුහුනපෑ බව සඳහන් කල පුවත්පතකට ප්‍රතිචාර වශයෙන් අර්ථශාස්ත්‍රඥයෙකු වන කෙසිවන් ඩෙරාඩ් කියා සිටියේ "යටත් පිරිසෙයින් වසර 25 කාලයක් පුරා කල සමීක්ෂන වලින්" තමාට දැකගත හැකි වූයේ, "පිරිහීම අරම්භ වූයේ 2009 වසරේ පටන්" බවත් මේ වසරට ප්‍රක්ෂේපනය කර තිබෙන වර්ධනය තුලින් එය පියවාගත හැකිදැයි තමාට සහතික කල නොහැකි බවත් ය. "ද්‍රෝනිය කෙතරම් ගැඹුරු ද යත්, උපනති රේඛාවට ආපසු පැමිනීමට නම් අප 2010 වසරේදී හොඳ වර්ධනයක් ඇතිකරගත යුතුය."

ඔක්ලහෝමාහි පුද්ගල ධන පරිහානිය සියයට 0.8 කි. එය බිලියන 1.1 ක අගයකි. එක්සත් ජනපද වානිජ්‍ය දෙපාර්තමේන්තුවේ ඩේවිඩ් ලෙන්සි උපුටා දැක්වූ *තුල්සා වර්ල්ඩ්* පුවත්පත සඳහන් කලේ, "බොහෝ ප්‍රාන්ත අත්දුටුවේ පිරිහීමකි. ඔක්ලහෝමාහි ප්‍රධාන ප්‍රශ්නය ලෙස පෙනී යන්නේ කැනීම් කටයුතු හා පසුගිය වසරේ මිල ගනන් පහත වැටීමය. එහෙත් වඩාත් වැදගත් කරුන නිෂ්පාදන ක්ෂේත්‍රයේ පරිහානියයි."

එක්සත් ජනපද ආර්ථික විශ්ලේෂන කාර්යාංශයට අනුව දකුනු ඩැකෝටාහි 2009 වසරේ පිරිහීම සියයට 3.5 කි. මෙය ජාතික සාමාන්‍යය වූ සියයට 1.7 මෙන් දෙගුනයකටත් වැඩි ප්‍රමානයකි. මෙහි වැඩි බරක් පැටවුනේ ගොවීන් මතය.

මේ අතර මූල්‍ය හා ව්‍යාපාරික පැලැන්තිය දිගින් දිගටම ආර්ථිකය කොල්ල කමින් තව තවත් ධනය ගොඩගසා ගනිති. ආදායම් අසමානතාව දශක ගනනාවක උච්ඡතම තැනට පැමින ඇත. ෆෝබ්ස් සඟරාවට අනුව දැන් එක්සත් ජනපදය තුල බිලියනපතියන් 403 දෙනෙක් සිටියි. මොවුන් ජාතික ධනයෙන් සියයට 8 ක් පාලනය කරන අතර ජාතියේ ජනගහනයෙන් නියෝජනය කරන්නේ සියයට 0.00014 ක් පමනි.

© www.wsws.org